**ජාතික ලොතරැයි මණ්ඩලය - 2017**

**-----------------------------------------**

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1963 අංක 11 දරන මුදල් පනතේ අංක 11 (ආ) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2018 අගෝස්තු 30 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත 07**

---

ප්‍රමිතයේ 08 ඡේදය ප්‍රකාරව, සෑම වර්ගයකටම අයත් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල ධාරණ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හෝ සටහන්වල හෙළිදරව් කළ යුතු වුවත් මණ්ඩලය සතු ණයගැතියන් හා ගෙවිය යුතු වෙනත් වගකීම් වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල එසේ හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

---

ප්‍රමිතියේ 103 ඡේදය ප්‍රකාරව, රු.235,767,246 ක ජාතිය ගොඩනැගීමේ බදු වියදම මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් වියදම් යටතේ වර්ගකර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07**

---

(i) ආයෝජන දේපල (Investment Property) යටතේ වර්ග කර ඇති සංචාරක බංගලාවලින් සමාලෝචිත වර්ෂයේදී මුදලින් ලැබී තිබුණු රු.827,011 ක කුලී ආදායම ප්‍රමිතයේ 16 වන ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් හා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් ඌන හා අධි තක්සේරු වී තිබුණි.

(ii) ප්‍රමිතියේ 17 වන ඡේදයේ උපදෙස්වලට අනුකූල නොවන අයුරින් රු.4,546,578 ක සේවක පාරිතෝෂික ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(iii) ප්‍රමිතියේ 28 වන ඡේදය ප්‍රකාරව විදේශ මුදල් දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමෙන් හටගත් උපලබ්ධි නොවූ ලාභ රු.7,199,256 ක් බදු පෙර ලාභයෙන් අඩු කර මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ වල ආරම්භක ශේෂයට ගැලපීම් කර නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.1,120,934,690 ක් වූ ආදායම් බදු මුදල ප්‍රමිතියේ 35 වන ඡේදයේ උපදෙස්වලට අනුකූල නොවන ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවත් ඊට පටහැනිව මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(v) විගණනයේදී සිදු කළ ගණනය කිරීම් අනුව, ජංගම වත්කම්වල විචලනයන් රු.548,478,160 කින් වැඩියෙන් හා වෙළෙඳ සහ වෙනත් වගකීම්වල විචලනයන් රු.549,999,999 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(vi) ත්‍යාග හා සංචිත ගිණුමට බැරකර තිබූ රු.480,416,033 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී බදු පෙර ලාභයට ගලපා තිබීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08**

**-------------------------------**

**(i)** ප්‍රමිතයේ 30 හා 31 ඡේද ප්‍රකාරව, ප්‍රකාශයට පත්කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණ කාලපරිච්ඡේදයට බලාත්මක වී නොමැති "මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමේ ප්‍රමිති", මණ්ඩලය විසින් අනුගමනය කර නොමැති විටක වුවද එය හෙළිදරව් කළ යුතුය. එහෙත්, ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමේ ප්‍රමිත 9,15 හා 16 හි සිදු වී තිබූ වෙනස සම්බන්ධයෙන් එපරිදි හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12**

**---------------------------------**

(i) ප්‍රමිතියේ 46 ඡේදය ප්‍රකාරව ප්‍රවර්තන හා පූර්ව කාලපරිච්ඡේද සඳහා ප්‍රවර්තන බදු වගකීම් (වත්කම්), නීතිගත කර ඇති හෝ වාර්තාකරනු ලබන දිනට නීතිගත කර ඇති බදු අනුපාතයන් (සහ බදු නීති) උපයෝගී කර බදු අධිකාරීන්ට ගෙවීමට (හෝ ඔවුන්ගෙන් අයකර ගැනීමට) අපේක්ෂිත බදු මුදල් පදනම් කරගෙන මැනිය යුතු විය. එහෙත් මණ්ඩලයේ ආදායම් බදු ප්‍රතිපත්තිය සඳහා ප්‍රමිතයේ උපදෙස් පිළිපැද ඇති බවත් නිරීක්ෂණය නොවීය.

(ii) ප්‍රමිතියේ 81 (උ) ඡේදය ප්‍රකාරව, විලම්භිත බදු (deferred tax) පිළිබඳව අදාල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(iii) මණ්ඩලය විසින් ඉකුත් වර්ෂයන්ට අදාලව ප්‍රතිවර්ත්‍ය (Reverse) කර රඳවාගත් ලාභයට ගැලපීම් කර තිබූ රු.64,766,800 ක උපචිත වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.35,621,740 ක ආදායම් බදු ප්‍රතිපාදනයක් සිදුකර තිබුණද මෙම ප්‍රමිතයේ 62 (අ) ඡේදයට පටහැනි ලෙස එය සමාලෝචිත වර්ෂයේ බදු වියදමක් ලෙස සලකා කටයුතු කර තිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18**

**-------------------------------**

ප්‍රමිතයේ 9 ඡේදය ප්‍රකාරව, එකතු කර ගැනීමට අපේක්ෂිත ගණනය කළ ආදායම හෝ එහි අපේක්ෂිත ලැබීම හෝ ලැබී ඇති ආදායම සාධාරණ වටිනාකමට මැනිය යුතු වුවත් මණ්ඩලයේ අයහාර හඳුනා ගැනීමේ ප්‍රතිපත්තියට එය අන්තර්ගත කර නොතිබුණි.

(ඊ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24**

(i) ප්‍රමිතයේ 16 වන ඡේදය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි 25 වන ඡේදය ප්‍රකාරව පහත සඳහන් කළමනාකරන හා සේවක ප්‍රතිලාභ වර්ගවල එකතුන් වෙන් වෙන් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව්කර නොතිබුණි.

(අ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ
(ආ) පශ්චාත් සේවා ප්‍රතිලාභ
(ඇ) වෙනත් දිගුකාලීන ප්‍රතිලාභ
(ඈ) සමාප්ති ප්‍රතිලාභ

(ii) ප්‍රමිතයේ 25 සහ 26 ඡේද ප්‍රකාරව රජයේ ආයතන හා වෙනත් ආයතන සම්බන්ධයෙන් නොපියවූ ශේෂයන් වෙතොත් එය හෙළිදරව් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ලොතරැයිපත් විකුණුම් මත ගෙවනු ලබන එකතු කළ අගය මත බදු මුදල් ආදායම් ප්‍රකාශනයේ විකුණුම් ආදායමෙන් අඩුකර දැක්වීම මණ්ඩලයේ ප්‍රතිපත්තිය වී තිබුණද මණ්ඩලය විසින් යෙදවුම් මත (Input) කලින් ගෙවා තිබූ එකතු කළ අගය මත බදු මුදල් සඳහාද නැවත හිමිකම් පා තිබුණු බව නිරීක්ෂණය විය.

**2.2.4 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් වාර්ෂික ඇස්තමේන්තු අගයන් වියදම් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබූ අතර ඊළඟ වර්ෂයේදී ජ'නල් සටහන් මගින් වියදම් ප්‍රතිවර්තනය කිරීමේ (Reverse) ක්‍රමවේදයක් අනුගමනයකර තිබුණි. ඒ අනුව, 2016 වර්ෂයේදී රු.54,966,857 ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 69 වන ඡේදයට අනුකූල නොවන ලෙස උපචිත වියදම් ලෙස හඳුනාගෙන තිබූ අතර ජ'නල් සටහන් මගින් 2016 වර්ෂයේදී රු.48,766,800 ක් රඳවාගත් ලාභයටද 2017 වර්ෂයේදී රු.49,415,642 ක් වෙනත් ආදායමක් ලෙස හා රු.5,551,215 ක් වියදම් වලින් අඩුකිරීමද සිදුකර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉහත ගිණුම්කරණ ක්‍රමවේදය හේතුවෙන් 2016 වර්ෂයේ ලාභය සියයට 13 කින් ඌන තක්සේරුවීමක් සහ 2017 වර්ෂයේ ලාභය සියයට 39 කින් අධිතක්සේරු වීමක් සිදුවී තිබුණි.

(ii) 2017 වර්ෂයේදී ප්‍රතිවර්තනය කරන ලද උපචිත වියදම් තුළ ඇතුළත් ප්‍රචාරණ වියදම් මත රු.2,396,152 ක අතිරේක බද්දක් ගෙවීමට මණ්ඩලයට සිදු වී තිබුණි.

(iii) ඉහත ගිණුම්කරණ දෝෂය හේතුවෙන් 2016 හා 2017 වර්ෂවල ආදායම් බදු වගකීම පිළිවෙලින් රු.30,231,771 කින් ඌන ගණනය වීමද රු.57,053,511 කින් අධි ගණනය වීමද සිදු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද දිනුම් වාරයන් වෙනුවෙන් ත්‍යාග සඳහා වෙන් කිරීම්වලින් ඉතිරිව පැවති රු.480,416,033 ක් රඳවාගත් ලාභයට නැවත හර කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු.1,355,557 ක් වූ හානිකරණ අලාභය බදුකරණ ලාභය ගණනය කිරීමේදී වර්ෂයේ ශුද්ධ අතිරික්තයට එකතු කර නොතිබීම හේතුවෙන් ආදායම් බදු වටිනාකම රු.745,556 ක් අඩුවෙන් ගණනය වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ලොතරැයිපතක මිල රු.30 ක් දක්වා වැඩි කිරීම හේතුවෙන් සිදු වී තිබූ අලෙවි පසුබෑම වලක්වා ගැනීම සඳහා මණ්ඩලය විසින් රු.16,525,700 ක් වටිනා ලොතරැයිපත් මිලදීගෙන තිබූ අතර එම ලොතරැයිපත්වල පිරිවැය වියදමක් ලෙස හඳුනාගෙන තිබූ නමුත් බදුකරණ ලාභය ගණනය කිරීමේදී ඒ සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේනතුවෙන් සනාථ කරගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ලොතරැයි බෙදාහැරීමේ නියෝජිතයන් විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් නොකළ ලොතරැයිපත් 176,313 ක් වෙනුවෙන් දඩ මුදල් ලෙස අයවිය යුතු රු.3,526,260 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඊ) මණ්ඩලය විසින් පෞද්ගලික බැංකුවක ආයෝජනය කර තිබූ රු.5,336,575 ක මුදලක් 2008 අප්‍රේල් 23 දිනැති අංක 1546/18 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් රජයට පවරා ගෙන තිබුණද, ඒ සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු නොකර එම මුදල ආයෝජන යටතේ තවදුරටත් දක්වා තිබුණි.

(උ) 2016 හා ඊට පෙර වර්ෂවලදී විශේෂ දිනුම් වාරවලදී මිලදීගෙන ත්‍යාග ලෙස ප්‍රදානය නොකළ පොත් අගය රු.682,561 ක් වටිනා රන් පවුම්, රන් කාසි හා රන් ආභරණ යනාදියෙහි සාධාරණ අගය තක්සේරු කර අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(ඌ) 2016 වර්ෂයේදී ණය පදනම මත නියෝජිතයන්ට ලබාදී තිබුණු ක්ෂණික ලොතරැයිපත් වලින් රු.13,174,730 ක් වටිනා ලොතරැයිපත් ආපසු හරවා එවා තිබුණද ඒවා ආපසු හරවා එවූම් ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) මූල්‍ය ප්‍රකාශනවල යොදාගත් ඉදිරිපත් කිරීමේ ක්‍රමය ඇතුලු රාජ්‍ය ප්‍රදාන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය සහ එම රාජ්‍ය ප්‍රදානයෙහි ස්වභාවය හා ප්‍රමාණය යන කරුණු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබූ අතර මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රදානය කර තිබූ රු.5,795,000 ක් වූ මෝටර් රථයේ වටිනාකම, වෙනත් ආදායමක් ලෙස සලකා ගිණුම්ගතකර තිබුණි.

(ඒ) විදේශ විනිමය දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී මුදල් පොතේ ආරම්භක ශේෂය දෝෂ සහිතව ඉදිරියට ගෙන ඒම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ විදේශ විනිමය ලාභය රු.7,199,256 කින් අධි ගණනය වී ඇති බව නිරීක්ෂණය විය.

### 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

------------------------------

මණ්ඩලය විසින් ලොතරැයි නියෝජිතයින් 128 දෙනෙකු වෙතින් අයවිය යුතු රු.223,894,560 ක් සඳහා ශේෂ සනාථන ඉල්ලා තිබූ නමුත් නියෝජිතයින් 7 දෙනෙකු විසින් පමණක් ශේෂ සනාථන ලබාදී තිබුණි. තවද ශේෂ සනාථ කිරීම් එවන ලද නියෝජිත ආයතන 04 ක ශේෂ සනාථ කිරීම්, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ශේෂ සමග සැසඳීමේදී රු.2,885,435 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා හේතු පැහැදිලි නොකෙරුනි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ණය පදනම මත අලෙවි නියෝජිතයින් 440 දෙනෙකු වෙත 2014 වර්ෂය හා ඊට පෙර නිකුත් කර තිබු ලොතරැයි අලෙවි කුට් වෙනුවෙන් අයවිය යුතු රු.3,527,572 ක් ද අලෙවි නියෝජිතයින් 49 කට ලබාදී තිබූ පාපැදි වෙනුවෙන් 2016 වර්ෂයට හා ඊට පෙර සිට අයවිය යුතු රු.382,700 ක්ද වශයෙන් එකතුව රු.3,910,272 ක් වූ වාරික මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති එකතුව රු.223,894,561 ක් වූ වෙළෙඳ ණයගැති ශේෂය තුළ එකතුව රු.4,839,325 ක් වූ ශේෂ ලොතරැයි අලෙවි නියෝජිතයින් 09 දෙනෙකු ගෙන් වර්ෂ 02 ට අධික කාලයක සිට අයවිය යුතුව පැවතුණි.

(ඇ) ණයගැතියන් තුළ ඇතුළත් 2014 වර්ෂයේදී මියගිය අලෙවි නියෝජිතයෙකුගෙන් ලැබිය යුතුව පැවති රු.467,600 ක ශේෂය සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඈ) අලෙවි නියෝජිතයින්ට අදාලව මණ්ඩලයේ වෙනත් ණයගැති ශේෂය තුළ ඇතුලත්ව ඇති එකතුව රු.1,317,614 ක් වටිනා ශේෂ නිශ්චිතව හඳුනාගෙන නොතිබූ අතර එම ශේෂ වර්ෂ 07 ක කාලයක පෙර සිට පැවත එන බව නිරීක්ෂණය විය.

(ඉ) 2016 වර්ෂයේදී අලෙවිය වැඩිකර ගැනීමේ අරමුණෙන් මණ්ඩලයේ සේවය කරන කලාප කළමනාකරුවන් දෙදෙනෙකුගේ පුද්ගලික නමට ණය පදනම මත රු.105,000 ක් වටිනා ක්ෂණික ලොතරැයිපත් නිකුත් කර තිබූ නමුත් 2018 මැයි 30 දින වන විටත් එම මුදල් මණ්ඩලය වෙත පියවා නොතිබුණි.

(ඊ) මණ්ඩලයට ජලය සහ ඉන්ධන සැපයීම වෙනුවෙන් බාහිර ආයතන 02 ක තැන්පත් කර තිබූ රු.202,500 ක් වර්ෂ 04 කට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණු අතර අදාළ ආයතන මේ වන විට මණ්ඩලය වෙනුවෙන් සේවා සැපයීමක්ද සිදු නොකරන බව නිරීක්ෂණය විය.

(උ) ණයගැති ශේෂය තුළ 32 වන කලම්බූ එයාර්පෝට් සුපර් ඩ්‍රෝ ලොතරැයිය වෙනුවෙන් මණ්ඩලයට අයවිය යුතු රු.11,251,109 ක් 2017 දෙසැම්බර් 31 දිනට අයවී නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයේදී මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති අලෙවි නියෝජිතයින් 128 දෙනෙකුගෙන් 32 දෙනෙකු පමණක් ඇප බැඳුම්කර තබා තිබූ අතර ඇප තබා ඇති අලෙවි නියෝජිතයින්ට එම ඇප සීමාව ඉක්මවා රු.22,411,113 ක හා ඇප බැඳුම්කර තබා නොතිබුණු අලෙවි නියෝජිතයින් 96 දෙනෙකු වෙත රු.161,374,396 ක් වටිනා ක්ෂණික ලොතරැයිපත් නිකුත් කර තිබුණි. 2016 වර්ෂයේදී අලෙවි නියෝජිතයින් 40 දෙනෙකු වෙත ණයට අලෙවි කළ රු.26,067,256 ක් වූ ක්ෂණික ලොතරැයිපත් වෙනුවෙන් අයවිය යුතු මුදල් 2018 මැයි 30 දින වන විටත් පියවීම කර නොතිබූ අතර ඇප බැඳුම්කර මගින්ද එම මුදල පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) හිඟහිටි කාලපරිච්ඡේදය හඳුනාගත නොහැකි අනෙකුත් ණයගැති ශේෂය ඇතුලත් රු.1,232,991 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඒ) ණයහිමි පාලන ගිණුමෙහි ඇතුලත් රු.3,585,823 ක ශේෂයට අදාල කේවල ණයහිමි ශේෂ ලැයිස්තුව ඉදිරිපත් නොවූ අතර 2016 වර්ෂයට පෙර සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ශේෂය නොවෙනස්ව පැවති අතර එම ශේෂ නිරවුල් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඔ) වර්ෂ 07 කට වැඩි කාලයක සිට ණයගිමියන් 05 දෙනෙකු යටතේ දක්වා ඇති රු.15,249,243 ක ණය ශේෂ පිළිබඳව විධිමත්ව සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් ලෙස කටයුතු කර තිබූ එහෙත් වර්ෂ 07 කට වැඩි කාලයක් අක්‍රියව සිටින අලෙවි නියෝජිතයින් 57 දෙනෙකු වෙත ගෙවිය යුතුව පැවති රු.1,502,083 ක් හා ලැබිය යුතුව පැවති රු.556,606 ක් වූ ශේෂ නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

(ක) මණ්ඩලයේ සේවය කර සිටියදී 2003 වර්ෂයේදී මියගොස් ඇති සහ එම වසරේම වැඩ තහනමට ලක්වූ නිළධාරීන් දෙදෙනෙකුට ගෙවිය යුතු රු.240,983 ක් වූ දිරි දීමනා මුදල් නිරවුල් කිරීමකින් තොරව ගෙවිය යුතු ශේෂ ලෙස තවදුරටත් ගිණුම්වල දක්වා තිබුණි.

(ග) වර්ෂ ගණනාවක සිට දිස්ත්‍රික් අලෙවි නියෝජිතයන් සඳහා ගෙවිය යුතුව පැවති රු.404,017 ක් විධිමත් පරිදි නිරවුල් කිරීමකින් තොරව වැඩිපුර අයකරගත් පරිගණක වාරික ලෙස ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතිණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1997 අංක 35 දරන මුදල් (සංශෝධිත) පනතින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනත | |
| (i) 14 (2) හා 16 (1) හා 16 (4) වගන්ති | මණ්ඩලය විසින් වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අධිකාරි වෙනුවෙන් ලොතරැයි පැවැත්වීමේදී අදාළ ආයතන සමග ගිවිසුමකට එළඹිය යුතුය. එහෙත්, ගොවිසෙත, සුපිරි වාසනා සම්පත, ජාතික සම්පත, නීරෝගා හා සෙවන ලොතරැයි වෙනුවෙන් අදාළ ආයතන සමග ගිවිසුම්ගතවීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.7,482,186,980 ක් ත්‍යාග ලෙස පිරිනමා තිබුණි. තවද ත්‍යාග ලබා ගැනීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ රු.160,104,460 ක මුදල් ත්‍යාග පමණක් ඒකාබද්ධ අරමුදලට මාරුකර තිබූ අතර මුදල් නොවන ත්‍යාගයන් මාරුකර නොතිබුණි. |
| (ii) 17 (2) වගන්තිය | ලොතරැයි ආදායමින් අදාළ වියදම් අඩුකළ පසු ඉතිරි මුදල ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් ඉකුත් වර්ෂවලට අදාළව එසේ බැර කිරීමෙන් තොරව රු.653,427,833 ක් රඳවා තිබුණි. |
| (iii) 20(2)(1) වගන්තිය | මණ්ඩලය විසින් ලොතරැයි පැවැත්වීම සම්බන්ධයෙන් රීති සකස් කර විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ගැසට් පත්‍රයේ පල කළ යුතු වුවද 2013 වර්ෂයේ සිට හඳුන්වාදී තිබූ නව ලොතරැයිපත්වන මෙගා පවර්, නීරෝගා, ඩොලර් ෆෝචූන්, රන් කිරුළ හා සෙවන යනාදිය සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. මෙම ලොතරැයිපත්වල අලෙවි ආදායම රු.2,851,185,380 ක් වූ අතර එම ආදායමින් රු.1,382,509,976 ක් ත්‍යාග සඳහා ද රු.529,309,006 ක් අලෙවි නියෝජිත කොමිස් වෙනුවෙන් ද ගෙවා තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය
--------------------------------------

| | |
|---|---|
| **(i)** VIII වන පරිච්ඡේදයේ 10.1 ඡේදය හා 10.2 ඡේදය | සතිඅන්ත හෝ රජයේ නිවාඩු දිනවල රාජකාරීවල නිරත වීම වෙනුවෙන් පැය 08 කට නොඅඩු එක් දිනක් සඳහා වැටුපෙන් 1/20 ක දීමනාවක් ලබාදිය හැකි වුවද එම විධිවිධාන නොසලකා මණ්ඩලය විසින් පැය 12 ඉක්මවා රාජකාරී ඉටුකරන සෑම එක් දිනක්ම දින දෙකක් රාජකාරී කළ සේ සලකා ගෙවීම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එසේ දින දෙකක් සේ සැලකූ අවස්ථා 30 ක් වෙනුවෙන් ගෙවා තිබූ මුදල රු.71,095 ක් විය. තවද, සතියේ වැඩකරන දිනයන්ද රජයේ නිවාඩු දිනයන් සේ සලකා නිවාඩු දින වැටුප් ගෙවා තිබූ අවස්ථා 16 ක් නිරීක්ෂණය වූ අතර එසේ ගෙවා තිබූ මුදල රු.23,940 ක් විය. |
| **(ii)** XXIV පරිච්ඡේදයේ 11 වන වගන්තිය සහ 2018 ජනවාරි 23 දිනැති පීඊ/එල්ඕ/එන්එල්බී/කෝප් /2018 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපිය | 2005 ජනවාරි 01 දින සිට දේපල ණය ලබාදීම බැංකු මගින් සිදුකළ යුතු අතර ඒ පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින්ද අවධාරණය කර තිබියදීත් ඒ පිළිබඳ නොසලකා සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 15 දෙනෙකු වෙත රු.23,496,950 ක දේපල ණය මණ්ඩලයේ මුදල් උපයෝගී කරගෙන ලබාදී තිබුණි. එසේම දේපල ණය සඳහා විධිවිධාන ප්‍රකාරව නිලධාරියාගෙන්, අය කරගත යුතු පොළිය නොසලකා සෑම නිලධාරියෙකුටම සියයට 4 ක අවම පොළී අනුපාතය යටතේ ණය ලබා දී තිබුණි. |
| (ඇ) 2011 පෙබරවාරි 9 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිල වාහන සඳහා හිමිකම ඇති නිලධාරින් 04 දෙනෙකු වෙනුවෙන් මාසිකව ලබාදිය හැකි ඉන්ධන දීමනා සීමාව ඉක්මවා රු.1,628,536 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඈ) 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | නිල වාහන සඳහා හිමිකම් නොමැති කලාප කළමනාකරුවන් 24 දෙනෙකු සහ අලෙවි ප්‍රවර්ධන නිලධාරින් 17 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු.3,298,368 ක ඉන්ධන දීමනා ගෙවා තිබුණි. |

(ඉ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ
--------------------------

| | |
|---|---|
| (i) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛය | |
| • 6.5.1 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමග විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| • 9.12 ඡේදය | - භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2006 වර්ෂයේ මණ්ඩලය විසින් අසරණ සරණ නමින් අරමුදලක් ආරම්භ කර ඒ සඳහා ලොතරැයි ත්‍යාග ලාභීන්ගේ පරිත්‍යාග හා නීරෝගා ලොතරැයි අලෙවි ආදායමෙන් සියයට 0.5 ක ප්‍රතිශතයක් එම අරමුදලට බැර කර තිබුණි. |

| | | |
|---|---|---|
| | | - මණ්ඩලයේ සභාපතිනියගේ අනුමැතිය මත කාර්ය මණ්ඩලය සඳහා රු.15,605,217 ක සුභසාධක දීමනාවක් ගෙවා තිබුණද ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. ඉකුත් වර්ෂවලදීද මෙම දීමනාව ගෙවා තිබුණි. |
| (ii) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන චක්‍රලේඛය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛය | • භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්ය මණ්ඩලය සඳහා දිරිදීමනා යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ දිරිදීමනා ලෙස එසේ ගෙවා ඇති මුදල රු.77,792,278 ක් විය.<br>• රජයේ අනුමත සංයුක්ත දීමනාව වෙනුවට එක් දිනකට උපරිම ලෙස රු.3,000 දක්වා වූ විශේෂ ප්‍රවර්ධන දීමනාවක් කාර්ය මණ්ඩලයට ලබාගත හැකි වන පරිදි විධිවිධාන සලසා තිබුණද ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී එසේ ගෙවා ඇති මුදල රු.3,470,700 ක් විය. |
| (iii) | 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී/03/2015 දරන චක්‍රලේඛයේ 2.5 ඡේදය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් සභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂක වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු.286,185 ක දිරිදීමනාවක් ගෙවා තිබුණි. |
| (iv) | 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරන චක්‍රලේඛය | මණ්ඩලය විසින් වාර්ෂික ප්‍රචාරණ සැලැස්මක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව රු.940,272,567 ක් ගෙවා තිබූ අතර ඉකුත් වර්ෂයේදී රු.1,013,545,562 ක් ඒ සඳහා දරා තිබුණි. |
| (ඊ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 හා 05 ඡේදය | සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබූ වාහන අපහරණ මණ්ඩලයට යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු මෙන්ම වාහන තක්සේරු මණ්ඩලයට මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකයකු පත් කිරීමෙන් තොරව වාහන 05 ක් හා යතුරු පැදි 09 ක් අලෙවි කර තිබුණි. |
| (උ) | 1993 ජනවාරි 21 දිනැති අංක පීඊ1/70/7/Vol.11 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය | රජය වෙනුවෙන් පවත්වනු ලබන සියලු ලොතරැයි ආදායමෙන් සියයට 16.5 ක ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබූ සම්පත් රේඛා, මෙගා පවර් හා සුපිරි දෙලක්ෂපති යන ලොතරැයි ආදායමින් සියයට 10 ක් පමණක් ප්‍රේෂණය කිරීම නිසා තවදුරටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකළ වටිනාකම රු.180,353,340 ක් විය. |

**2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලොතරැයි දිනුම් ඇදීමේ වාර සඳහා සහභාගීවන මණ්ඩලයේ නිලධාරීන්ට විධිමත් සේවා චක්‍රයක් හා නිශ්චිත රාජකාරී පැවරීමෙන් තොරව එක් දිනුම්වාරයක් සඳහා රු.1,200 සිට රු.4,500 දක්වා වූ පරාසයක ගෙවීම් සිදුකරනු ලැබුවද ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී පමණක් එසේ ගෙවා තිබූ මුදල රු.55,932,000 ක් විය.

(ආ) කාර්ය මණ්ඩලය විසින් දිවයින පුරා ප්‍රචාරණ රථ මගින් රු.64,724,000 ක් වටිනා ලොතරැයිපත් අලෙවි කර තිබූ අතර ඒ මත සියයට 17.5 ක විකුණුම් කොමිස් මුදල වූ රු.11,326,700 ක් සමාලෝචිත වර්ෂයේදී එම කාර්යයේ නියුතු රියදුරු හා ප්‍රචාරක නිලධාරීන් වෙත ගෙවා තිබුණි. කෙසේ වුවද එම කාර්යය සඳහා විධිමත් අධිකාරී බලයක් විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(ඇ) කාර්ය මණ්ඩලය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන විවිධ අරමුදල් 04 ක් විගණනය කිරීම සඳහා පෞද්ගලික විගණකවරුන් පත්කර තිබූ අතර එම විගණකවරුන් සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.235,000 ක් විගණන ගාස්තු ලෙස මණ්ඩලයේ අරමුදලින් ගෙවා තිබුණි. මෙම ගෙවීම සඳහා විධිමත් අධිකාරී බලයක් විගණනයේදී ඉදිරිපත් නොවීය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලය සතු ආයෝජන වෙනුවෙන් ලද පොලී ආදායම රු.310,402,912 ක් වූ අතර විගණනයේදී සිදුකළ ගණනය කිරීම අනුව පොලී ආදායමින් සියයට 46 ක් හෙවත් රු.144,994,647 ක් උපයා තිබුණේ ත්‍යාග සංචිත අරමුදලෙහි වූ මුදල් ආයෝජනය කිරීමෙන් විය. එහෙත් උපයා ඇති පොලී ආදායම විධිමත් අධිකාරී බලයකින් තොරව වර්ෂයේ ආදායමට බැර කර තිබුණි.

(ඉ) 2017 අප්‍රේල් 13,14 හා 15 යන දිනවලදී ගාල්ල නියාගම හා අගුණකොලපැලැස්ස සිදුකළ සිංහල අළුත් අවුරුදු වැඩසටහන්වලට සහභාගී වූ නිලධාරීන් 18 දෙනෙකු සඳහා රු.119,000 ක විශේෂ ප්‍රවර්ධන හා විශේෂ රාජකාරී දීමනාවක්ද ඊට අමතරව රු. 21,000 ක් වටිනා රු.500 ත්‍යාග වවුචර් 42 ක්ද පිරිනමා තිබුණි. එම දීමනා සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.139,805,208 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.414,761,431 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.274,956,223 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ලොතරැයි විකුණුම් ආදායම සියයට 17 කින් පමණ අඩුවීම හේතුවෙන් දළ ලාභය රු.556,845,017 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 සහ 2014 වර්ෂ වලදී මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් ලබා තිබූ නමුත් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම අනෙකුත් වර්ෂයන්හිදී මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තයක් ලබා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 67 කින් පිරිහී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී

2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම දායකත්වය ධන අගයක් ගෙන තිබුණි. එහෙත් ඉකුත් වර්ෂයන්ට සාපේක්ෂව 2014 සහ 2017 වර්ෂයේ දායකත්වයේ පිරිහීමක්ද 2015 සහ 2016 වර්ෂවල වර්ධනයක්ද නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේදී දායකත්වයේ පිරිහීම සියයට 15 ක් හෙවත් රු.717,906,549 ක් විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ ලාභදායීත්ව හා කාරක ප්‍රාග්ධන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| | **අනුපාතය** | **වර්ෂය** | |
|---|---|---|---|
| | | **2017** | **2016** |
| (i) | දළ ලාභ (ප්‍රතිශතය) | 12.36 | 13.02 |
| (ii) | ශුද්ධ ලාභ/(අලාභ) (ප්‍රතිශතය) | 0.83 | 2.05 |
| (iii) | ජංගම වත්කම් අනුපාතය | 1.65:1 | 1.34 : 1 |
| (iv) | ක්ෂණික වත්කම් අනුපාතය | 1.61:1 | 1.31 :1 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලොතරැයි අලෙවි ආදායම රු.3,423,237,530 කින් එනම් සියයට 17 කින් අඩුවී තිබූ අතර ඒ හේතුවෙන් දළලාභ අනුපාතයද 0.66 කින් පහළ ගොස් තිබුණි. මේ සඳහා ප්‍රධාන වශයෙන් සමාලෝචිත වර්ෂයේ විකුණුම් මත නිෂ්පාදන බද්දක් පැනවීමද හේතු වී තිබුණි.

(ආ) මණ්ඩලයේ ජංගම හා ක්ෂණික අනුපාත ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීමට තවදුරටත් අවධානය යොමුවිය යුතු අතර සමාලෝචිත වර්ෂයේ ක්ෂණික අනුපාතය 1.61:1 ක් ලෙස පෙන්නුම් කරනු ලැබුවද ත්‍යාග සංචිත අරමුදල හා සේවක පාරිතෝෂික අරමුදලේ ඒ සඳහා හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

2017 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව, කාර්ය සාධන ඇගයීම් සඳහා කාර්ය සාධන වාර්තාවක් පිළියෙල කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය ආරම්භ කර වසර ගණනාවක් ගතවී තිබුණද ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කර ගැනීමට අදාළව කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ 2016 හා 2017 වර්ෂයන්ට අදාළ ලොතරැයිපත් ආදායම හා ප්‍රචාරණ පිරිවැය පහත දැක්වේ.

| ලොතරැයියේ නම | විකුණුම් ආදායම | | | | ප්‍රචාරණ පිරිවැය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | 2016 | විචලනය | ප්‍රතිශතය | 2017 | 2016 | විචලනය | ප්‍රතිශතය |
| | රු.මි. | රු.මි. | රු.මි. | % | රු.මි. | රු.මි. | රු.මි. | % |
| මහජන සම්පත | 4,885 | 5,342 | (457) | (8.6) | 144 | 132 | 12 | 9.1 |
| වාසනා සම්පත | 814 | 1,143 | (329) | (28.8) | 74 | 93 | (19) | (20.4) |
| ගොවිසෙත | 4,053 | 4,011 | 42 | 1.0 | 135 | 121 | 14 | 11.6 |
| සුපිරි වාසනා | 1,023 | 1,683 | (660) | (39.2) | 69 | 83 | (14) | (16.9) |
| ජාතික සම්පත | 954 | 1,355 | (401) | (29.6) | 69 | 83 | (14) | (16.9) |
| සම්පත් රේඛා | 1,162 | 1,632 | (470) | (28.8) | 93 | 102 | (9) | (8.8) |
| වාසනා සම්පත සුපර් ෆිෆ්ටි | - | 154 | (154) | 0 | - | - | - | - |
| මෙගා පවර් | 1,298 | 1,135 | 163 | 14.4 | 79 | 79 | 0 | - |
| පවර් ලොටෝ | - | 72 | (72) | 0 | | - | - | - |
| නීරෝගා | 1,063 | 1,308 | (245) | (18.7) | 91 | 90 | 1 | 1.1 |
| මනුසත් මෙහෙවර | - | 30 | (30) | 0 | | - | - | - |
| සුපිරි දෙලක්ෂපති | 421 | 517 | (96) | (18.6) | 55 | 66 | (11) | (16.7) |
| රජ දිනුම | 101 | 140 | (39) | (27.9) | | - | - | - |
| සමෘද්ධි | 51 | 176 | (125) | (71.0) | - | 3 | (3) | (100) |
| සෙවණ | 848 | 1,475 | (627) | (42.5) | 40 | 4 | 36 | 900 |
| සුපිරි ගොවිසෙත | 73 | - | 73 | - | | - | - | - |

(i) ඉකුත් වර්ෂයේ අලෙවි කර තිබුණු ලොතරැයි වර්ග 15 ක් අතුරින් සමාලෝචිත වර්ෂයේදී ලොතරැයි වර්ග 03 ක් අලෙවි ඉලක්ක කරා ළඟා නොවීම හේතුවෙන් නවතා දමා තිබුණු අතර ඉතිරි ලොතරැයි පත් අතුරෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ලොතරැයි වර්ග 02 ක පමණක් ආදායම ඉහළ ගොස් තිබුණි. එහෙත් එම ආදායමේ වර්ධනය සියයට 15 කටත් වඩා අඩු අගයක් ගෙන තිබූ අතර ලොතරැයි වර්ග 10 ක ආදායම සියයට 8.6 සිට සියයට 71 දක්වා වූ පරාසයක් තුල පහල ගොස් තිබුණි. ඒ අනුව, සමස්ත ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 3,427 කින් අඩුවී තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 17 ක් විය.

(ii) ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ගොවිසෙත ලොතරැයියේ ආදායමේ ඉහලයාම රු.මිලියන 42 ක් හෙවත් සියයට එකක් වුවද එහි ප්‍රචාරණ වියදම සියයට 11.6 කින් ඉහළ ගොස් තිබුණි.

(iii) ඉහත දත්ත අනුව රු.මිලියන.4,885 ක ඉහලම ආදායමක් උපයා ඇති මහජන සම්පත ලොතරැයියේ ප්‍රචාරණ පිරිවැය විකුණුම් ආදායමින් සියයට 2.9 ක් ලෙස පහලම අගයක් ගෙන තිබුණද රු.මිලියන.1,162 ක ආදායමක් උපයා ඇති සම්පත් රේඛා ලොතරැයියේ ප්‍රචාරණ පිරිවැය විකුණුම් ආදායමින් සියයට 8 ක ඉහළ අගයක් ගෙන තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය මගින් රු.139,805,208 ක ලාභයක් ලබා තිබූ නමුත් විගණනයේදී සිදුකළ ගණනය කිරීම අනුව ලොතරැයි අලෙවි කිරීමෙන් පහත සඳහන් පරිදි රු.160,024,736 ක අවාසිදායක මූල්‍ය ප්‍රතිඵලයක් ලබා තිබුණි.

| | (රු.) |
|---|---|
| ශුද්ධ ලොතරැයි විකුණුම් ආදායම | 15,638,283,224 |
| විකුණුම් පිරිවැය | (13,567,962,820) |
| | --------------------- |
| දළ ලාභය | 2,070,320,404 |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | (1,130,365,799) |
| පරිපාලන වියදම් | (666,740,574) |
| මූල්‍ය පිරිවැය | (36,583,170) |
| ආදායම් බදු (පොලී ආදායම මත බදු හැර) | (396,655,597) |
| | --------------------- |
| ලොතරැයි අලෙවි කිරීමේ බදු පසු ශුද්ධ අලාභය | (160,024,736) |
| | ============ |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ලොතරැයිපතක විකුණුම් මිලෙන් මණ්ඩලයේ කටයුතු සඳහා වියදම් දැරීමට වෙන් කරනු ලබන ප්‍රතිශතය සියයට 22.18 ක් වුවද සියයට 23.88 ක් වැයකර තිබීම හේතුවෙන් වියදම් දැරීමට ඉඩදී ඇති සීමාව ඉක්මවා සියයට 1.7 ක් හෙවත් රු.284,702,063 ක් වැයකර තිබුණි.

(ii) ප්‍රවර්තන වර්ෂයේ මණ්ඩලයේ වෙනත් ආදායම්වල එකතුව රු.387,784,659 ක් වුවද වර්ෂයේ ශුද්ධ ලාභය රු.139,805,208 ක් වී මණ්ඩලයේ ප්‍රධාන මෙහෙයුම් කාර්යය වන ලොතරැයි විකිණීමෙන් ලබා තිබූ ඉහත අලාභය වෙනත් ආදායම්වලින් ආවරණය වී තිබීම හේතුවී තිබුණි.

(ඊ) ක්‍රියාකාරී සැලැස්මට අනුව, මහජන ඇමතුම් පද්ධති 1,000 ක් මිලදීගෙන නියෝජිතයන්ට බෙදාහැරීම සඳහා රු.6,110,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඒ අනුව සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 16 දින මහජන ඇමතුම් 650 ක් ඇනවුම් කර තිබුණි. එහෙත් 2018 ජනවාරි 19 දින වන විටත් එම භාණ්ඩ මණ්ඩලයට ලැබී නොතිබූ අතර එම භාණ්ඩවල ගුණාත්මකභාවය, කල්පැවැත්ම හා නියෝජිතයින්ට ඒවායේ අවශ්‍යතාවය පිළිබඳ විධිමත් අධ්‍යනයක් සිදුකර තිබූ බවද නිරීක්ෂණය නොවීය.

(උ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීමට සැලසුම් කර තිබූ රු.16,381,031 ක් වටිනා ලොතරැයි අලෙවි කුටි 375 ක් නිෂ්පාදනය කර සැපයීම සඳහා 2017 ඔක්තෝබර් 23 දින ඇනවුම් කර තිබුණු නමුත් 2018 මැයි 25 දින වන විටද සපයා තිබූ අලෙවි කුටි සංඛ්‍යාව 150 ක් පමණක් විය. සැපයුම්කරු සමග ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටද නොහැකි වී තිබුණි.

(ඌ) ඉකුත් වර්ෂයේදී පැවැත්වූ ලොතරැයි දිනුම් වාර සංඛ්‍යාව 1092 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එම සංඛ්‍යාව 1292 ක් දක්වා දිනුම් වාර 200 කින් වැඩිවී තිබුණි. එහෙත් ලොතරැයි අලෙවි ආදායම පසුගිය වර්ෂයට වඩා රු.3,423,237,530 කින් හෙවත් සියයට 17 ක ප්‍රතිශතයකින් අඩු වී තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වා තිබූ දිනුම් වාර සංඛ්‍යාව හා ප්‍රදානය කළ ත්‍යාග ව්‍යුහය සැලකිල්ලට ගැනීමේදී ත්‍යාග පරාසය 20 සිට 100 දක්වා ප්‍රදානය කළ ප්‍රතිශතය සියයට 99 ක් වූ අතර අනෙකුත් ත්‍යාග සඳහා වෙන්කර තිබූ ප්‍රතිශතය සියයට එකක පමණ ඉතා ඉහල පහල මට්ටමක පැවති බව පහත සඳහන් තොරතුරු අනුව නිරීක්ෂණය විය.

ලොතරැයි නාමය හා ප්‍රදානය කළ ත්‍යාග ප්‍රතිශතය

| 2017 පැවැති දිනුම් වාර සංඛ්‍යාව | ගොවිසෙත | ජාතික සම්පත | මහජන සම්පත | මෙගා පවර් | සෙවන | දෙලක්ෂපති | සුපිරි වාසනා සම්පත | වාසනා සම්පත | නීරෝගා | සම්පත් රේඛා |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **234** | **102** | **240** | **103** | **46** | **52** | **102** | **101** | **155** | **155** |
| ත්‍යාග පරාසය (රු.) | (%) | (%) | (%) | (%) | (%) | (%) | (%) | (%) | (%) | (%) |
| 20-100 | 99.7226 | 99.2466 | 99.2406 | 99.7214 | 99.6535 | 97.0014 | 99.6694 | 99.9122 | 99.4183 | 99.6683 |
| 250-2,000 | 0.2738 | 0.6841 | 0.6840 | 0.2747 | 0.2244 | 2.9840 | 0.3259 | 0.0861 | 0.5713 | 0.3254 |
| 10,000-50,000 | 0.0033 | 0.0623 | 0.0685 | 0.0036 | 0.1172 | - | 0.0043 | - | 0.0099 | 0.0059 |
| 100,000-200,000 | - | 0.0064 | 0.0062 | - | 0.0045 | 0.0146 | - | - | - | 0.0003 |
| 1,000,000 | 0.0003 | - | - | 0.0003 | - | - | 0.0004 | 0.0003 | 0.003 | - |
| 2,000,000 | - | 0.0006 | 0.0007 | - | 0.0004 | - | - | - | - | - |
| | 100 | 100 | 100 | 100 | 100 | 100 | 100 | 100 | 100 | 100 |

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ නියෝජිතයින්ගෙන් ඇප බැඳුම්කර ලබා ගැනීමේ අවශ්‍යතාවය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අවධාරණය කර තිබියදී එම තීරණය නොසලකා රු.8,290,055 ක අමතර පිරිවැයක් දරා ණයවර රක්ෂණාවරණයක් 2016 ජුලි සිට 2017 ජුලි දක්වා කාලයට අදාලව ලබාගෙන තිබුණි. එහෙත් මණ්ඩලය යටතේ ලියාපදිංචි වී සිටි නියෝජිතයන් 118 දෙනාගෙන් 27 දෙනෙකු මෙම යෝජනා ක්‍රමයට ඇතුළත් කරගෙන නොතිබුණු අතර ඒ සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. කෙසේ වුවද, 2016 හා 2017 වර්ෂ වෙනුවෙන් මාස 06 ඉක්මවා නොගෙවා ඇති ණය ශේෂය රු.42,073,492 ක් වුවද එම ණය ශේෂ අතුරින් අවදානම් සහිත ණය ශේෂ හඳුනාගෙන රක්ෂණාවරණ මගින් පියවා ගැනීමට කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(ආ) මණ්ඩලය විසින් මුද්‍රණය කරවා ගනු ලබන ලොතරැයිපත්වල අවශ්‍යතාවය නිසි පරිදි පුරෝකථනය කිරීමකින් තොරව මුද්‍රණ ඇණවුම් ලබාදීම හේතුවෙන් සෑම දිනුම් වාරයකම මුද්‍රිත ලොතරැයිපත්වලින් සියයට 12.26 ක පමණ ප්‍රමාණයක් නොවිකිණී ඉතිරිව පැවති අතර ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ අවසානයට ඉතිරිව පැවති ලොතරැයිපත්වල මුද්‍රණ පිරිවැය රු.53,282,897 ක් විය.

(ඇ) මණ්ඩලයේ තොගය බැහැර කිරීමේ ක්‍රමවේදය අනුව නොවිකුණු ලොතරැයිපත්වල සුන්බුන් අගය අතර හඳුනාගෙන ගිණුම්ගත කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ අරමුදල්වලින් ලබාදී තිබූ දේපල ණයවලට අදාළ ඔප්පු 108 ක් වෙනුවෙන් අවලංගු කළ නොහැකි අටෝර්නි බලය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ආයතනයේ කාර්ය මණ්ඩලය, දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින්, අලෙවි නියෝජිතයින් හා අලෙවි සහායකවරුන් ඇගයීම අපේක්ෂාවෙන් "මහත්මා" නමින් සම්මාන උළෙලක් පවත්වා තිබුණු අතර ඇගයීම් සඳහා නිර්ණායක සකස් කිරීමකින් තොරව මණ්ඩලය විසින් එහි අධීක්ෂණය හා මෙහෙයවීම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තෝරාගත් ප්‍රචාරණ සමාගමකට ලබාදී ඒ සඳහා රු.10,388,500 ක් ගෙවා තිබුණි. කෙසේ

වුවද, මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් මෙම ඇගයීම් ක්‍රියාවලියෙන් සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබූ අතර වැඩසටහන සඳහා අපේක්ෂිත සහභාගීත්වය නිසිලෙස ඇස්තමේන්තු කර නොතිබීම හේතුවෙන් 1,100 ක පිරිසක් සඳහා පහසුකම් සලසා තිබුණද සත්‍ය සහභාගීත්වය 700 දෙනෙකු වී තිබුණි.

(ඊ) 32 වන කලම්බු එයාර්පෝට් සුපර් ඩ්‍රෝ ලොතරැයිපත් අලෙවිය සඳහා ප්‍රසම්පාදනයෙන් තොරව අවස්ථා දෙකකදී තෝරාගත් ප්‍රචාරණ සමාගම් දෙකකට භාරදී තිබුණි. තවද, එම අලෙවි සමාගම් වෙත ලබාදීමට එකඟ වූ ලොතරැයිපත් සංඛ්‍යාව මත සියයට 85 ක් වූ එනම් රු.46,240,297 ක ඇප බැඳුම්කර ලබාගත යුතු වුවද ලබාගෙන තිබුණේ රු.2,200,000 ක ඇප බැඳුම්කරයක් පමණි. ඒ අනුව රු.44,040,297 ක ඇප බැඳුම්කර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) දේපළ පිරියත හා උපකරණ යටතේ වූ වත්කම් කාර්යාලීය විවිධ අංශයන් වෙත නිකුත් කිරීමේදී ඒවා නිවැරදිව ලේඛනගත නොවීමෙන් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී අස්ථානගත වූ බවට හඳුනාගෙන තිබූ රු.43,463,400 ක් වටිනා භාණ්ඩ අයිතම් 879 ක් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

(ඌ) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් දුරකථන 480 කට අධික මාසික බිල්පත් නිරවුල් කිරීමට අමතරව අංක 9 කරකවා සෘජු ඇමතුම් පහසුකම් ලබාගත හැකි දුරකථන සබඳතා 60 ක් ලබාදී තිබුණි. තවද 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/2/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, අනුමත දුරකථන දීමනාවන් ලබා ගන්නා නිලධාරීන් 15 දෙනෙකුට හා අනෙකුත් ශාඛා නිලධාරීන් 45 දෙනෙකුට එම දුරකථන පහසුකම්ද සපයා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දුරකථන පිරිවැය රු.30,214,282 ක් විය. තවද දුරකථන දීමනා ලබන නිලධාරීන් 17 දෙනෙකුගෙන් අනුමත සීමාව ඉක්මවා දරනු ලැබූ රු.514,299 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන මහජන සම්පත ලොතරැයියේ මුද්‍රණ කටයුතු 2008 වර්ෂයේ සිටද නීරෝගා ලොතරැයියේ මුද්‍රණ කටයුතු 2015 වර්ෂයේ සිටද රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව විසින් මේ දක්වා ඉටු කර තිබූ අතර ඒ සඳහා ලිඛිත ගිවිසුමක් නොවීය. 2016 වර්ෂය තුළදී ක්‍රියාත්මක කර තිබූ ලොතරැයිපත් මුද්‍රණ කටයුතු සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් එක් ටිකට්පතක් මුද්‍රණය කිරීම සඳහා ලැබී ඇති අවම මිල රු.0.3570 ක් වුවද රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත මහජන සම්පත එක් ලොතරැයිපතක් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.0.5021 ක්ද නීරෝගා ලොතරැයිපතක මුද්‍රණ පිරිවැය 0.6637 ක්ද ගෙවමින් පැවතුණි. තරඟකාරී මිල ගණන් සැලකිල්ලට නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පමණක් මහජන සම්පත ලොතරැයිපත් මුද්‍රණයෙන් සිදුවිය හැකි ඇස්තමේන්තුගත අලාභය රු.31,791,602 ක්ද, නීරෝගා ලොතරැයිපත් මුද්‍රණයෙන් ඇස්තමේන්තුගත අලාභය දළ වශයෙන් රු.7,815,276 ක්ද වී තිබුණි.

(ආ) මණ්ඩලය විසින් එහි ගිණුම් කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් 2003 වර්ෂයේදී හඳුන්වා දී තිබූ මධ්‍යගත Sage ACCPAC නැමැති පරිගණක මෘදුකාංගය 2016 වර්ෂයේදී විමධ්‍යගත කර තිබීම හේතුවෙන් එම මෘදුකාංගයෙන් ලබාගත හැකි සේවාවන් සීමිත වී තිබුණි. කලින් පැවති මධ්‍යගත ක්‍රමය මගින් ආයතනයේ ගනුදෙනු පිළිබඳව පැවති විශ්වාසනීයත්වයද මෙම විමධ්‍යගත ක්‍රමය යටතේ ප්‍රශ්නගත වී තිබුණු අතර, අදාළ වෙනස් කිරීම් නිසා ඇතිවන අවදානම්වල වගකීම භාර ගැනීම මෙම මෘදුකාංගය හඳුන්වාදුන් සමාගමද ප්‍රතික්ෂේප කර තිබුණි.

(ඇ) 2017 ජුනි 28 දින පැවති ගොවිසෙත 1,500 විශේෂ දිනුම් වාරය සඳහා මිලදීගෙන තිබූ රන්කාසි වලින් පොත් වටිනාකම රු.1,484,800 ක් වූ රන්කාසි 58 ක් 2018 මැයි 30 දින වන විටත් නැවත තක්සේරු කිරීමෙන් තොරව ගබඩාවේ ඉතිරිවී තිබුණි.

(ඈ) ජයග්‍රාහකයන් ඉදිරිපත් නොවූ ත්‍යාග මුදල් මණ්ඩලයේ අරමුදලට බැරකර අනතුරුව භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු වුවත් 2013/2014 වර්ෂයේදී ත්‍යාග සංචිත අරමුදලෙන් ත්‍යාග ප්‍රදානය සඳහා මිලදීගෙන තිබූ රු.2,350,000 ක් වටිනා ජීප් රථයක් අවස්ථා කිහිපයකදීම විශේෂ දිනුම් වාර සඳහා ඉදිරිපත් කලද ජයග්‍රාහකයෙක් බිහිවී නොතිබූ අතර මුදල් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව එය මණ්ඩලයේ පාවිච්චිය සඳහා යොදාගෙන තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව සම්පූර්ණයෙන්ම පැවරී නොතිබියදී මණ්ඩලය විසින් එහි නිලධාරියෙකුට රු.774,480 ක නිවාස ණය මුදලක් ලබාදී තිබූ අතර නිවස ඉදිකිරීමට යෝජිත ඉඩම එම ඉඩමේ හිමිකරු විසින් ජීවිත භුක්තිය තබාගෙන නිලධාරියාට පවරා දී තිබුණි. ඉඩමේ හිමිකරු විසින් විසින් එම ඉඩමේ භුක්තිය ඉවත් කරගෙන ඉඩමේ අයිතිය නිලධාරියාට පවරනු බවට වූ ලිඛිත ප්‍රකාශයක් පෞද්ගලික නීතිඥ සමාගමක් මාර්ගයෙන් ඉදිරිපත් කර තිබුණි. එහෙත් පසුව අදාළ දේපලේ භුක්තිය නැවත ඉල්ලා එම පාර්ශවය විසින් උසාවියේ නඩුවක් පවරා තිබූ අතර එහි පාර්ශවකරුවෙකු ලෙස මණ්ඩලය නම්කර තිබුණි. මණ්ඩලය තුල වෘත්තීය සුදුසුකම් ලත් නීතිඥයෙකු සිටියදී මෙම නඩුවේ නඩුවාර 11 ක් සඳහා මණ්ඩලය විසින් රු.211,475 ක් නීතිඥ ගාස්තු ලෙස බාහිර නීතිඥයන්ට ගෙවා තිබුණි.

(ආ) මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේ 01,02 හා 03 යන තෙදින තුළ පැවති ලොතරැයි වර්ග 06 කට අදාලව දිනුම් වාර 09 ක් වෙනුවෙන් මුද්‍රිත ලොතරැයිපත් 4,707,000 ක ප්‍රමාණයෙන් රු.32,556,000 ක් වටිනා ලොතරැයිපත් 1,085,200 ක් මණ්ඩලය විසින්ම මිළදීගෙන තිබීම හේතුවෙන් රු.16,845,862 ක් අමතර වියදමක් දැරීමට සිදු වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 2016 වර්ෂයේදී නියෝජිතයන් වෙත යවන ලදුව විකුණුම් ආදායමට බැර කර තිබූ රු.13,174,730 ක් වටිනා ක්ෂණික ලොතරැයිපත් සමාලෝචිත වර්ෂයේදී ආපසු එවා තිබුණද එය සැලකිල්ලට නොගෙන 2016 සමස්ත විකුණුම් පදනම් කරගෙන කාර්ය මණ්ඩලයට සහ නියෝජිතයන්ට රු.35,813,250 ක දිරි දීමනා ඉකුත් වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඈ) 32 වන කලම්බු එයාර්පෝට් සුපර් ඩ්‍රෝ හා ඩොලර් ෆෝචූන් ලොතරැයිපත් අලෙවිය ඇ.ඩො. හා ශ්‍රී ලංකා රුපියල් මගින් සිදු කළද එම සියලු ලැබීම් මණ්ඩලයේ බැංකු ගිණුමට බැර කළ යුත්තේ ඇ.ඩො. වේ. ඒ අනුව ශ්‍රී ලංකා රුපියල් මගින් එකතු කරගත් මුදල් ඇ.ඩො.බවට පත්කර ගැනීමට පෞද්ගලික මුදල් මාරු කරන්නන් සමග කටයුතු කිරීමට අලෙවි අංශයේ නිලධාරීන්ට අවිධිමත් අවසරයක් ලබාදී තිබුණි.

## 4.5 අරමුදල් කළමනාකරණය

--------------------------

මණ්ඩලය විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන රැස්කිරීමේ ගිණුමට අලෙවි නියෝජිතයින් විසින් මුදල් තැන්පත් කිරීමේදී බැංකුව විසින් සියයට 0.05 ක සේවා ගාස්තු වශයෙන් එකතුව රු.36,226,108 ක් අයකර තිබුණද ඒ පිළිබඳ මණ්ඩලය විසින් කිසිදු අවධානයක් යොමුකර නොතිබුණි.

**4.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

වෙළඳ සන්නාමකරණය සඳහා මණ්ඩලය විසින් 2015 දෙසැම්බර් 31 දින මිළදීගත් රු.7,650,000 ක් වටිනා ට්‍රක් රථ 02 ක්ද සමාලෝචිත වර්ෂයේදී රු.20,750,000 ක් වැයකර මිලදීගත් සිංගල් කැබ් රථ 05 ක්ද එම කාර්යය සඳහා යොදා නොගෙන 2018 මැයි 30 දින වන විටද ආයතන භූමියේ ගාල්කර තිබූ අතර මණ්ඩලය සතු අංක BMW (A1) 5860 මෝටර් රථයද නිෂ්කාර්යව පැවතුණි.

**4.7 ආර්ථික නොවූ ගනුදෙනු**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ නෛතික සේවා තනතුර සඳහා නීති නිලධාරියෙකු පත්කර සිටියදී සමාලෝචිත වර්ෂයේ දී නෛතික කටයුතු සඳහා බාහිර ආයතන වෙත රු. 1,656,000 ක් ගෙවා තිබුණි.

(ආ) 1269 වැනි ගොවිසෙත දිනුම්වාරයේ සිට උතුරු නැගෙනහිර ප්‍රදේශයට පමණක් සීමාවන පරිදි භාෂාව හා චිත්‍ර රටා වෙනස් කර සෑම දිනුම් වාරයකටම ලොතරැයිපත් 35,000 බැගින් මුද්‍රණය කර එම ප්‍රදේශයට පමණක් නිකුත් කර තිබුණි. ඒ අනුව දිනුම් වාර 157 කදී ලොතරැයිපත් 5,495,000 ක් මුද්‍රණය කර තිබූ නමුත් පිරිවැය රු.655,998 ක් සහිත මුළු ලොතරැයි පත් වලින් සියයට 34.10 ක් හෙවත් 1,874,280 ක් නොවිකිණී ඉතිරි වී තිබුණි.

(ඇ) 32 කලම්බු එයාර්පෝට් සුපර් ඩ්‍රෝ ලොතරැයිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ලොතරැයි අලෙවි කරන්නන් එකතු කරන ලද රු.26,691,000 ක මුදලක් නියමිත පරිදි බැංකු ගත නොකිරීම නිසා විගණකගේ ගණනය කිරීම් අනුව, මණ්ඩලයට ඍජුවම ලැබිය හැකි රු.184,100 ක පොලී ආදායමක් අහිමි වී තිබුණි.

(ii) මෙම ලොතරැයියේ ත්‍යාගය සඳහා ප්‍රදානය කළ යුතු රථයේ වටිනාකම ලොතරැයි ආදායමෙන් සියයට 47 ක ප්‍රතිශතයක් වන රු.12,697,755 ක් වුවද ප්‍රදානය කළ රථයේ වටිනාකම සියයට 67 ක ප්‍රතිශතයක් වන රු.18,000,000 ක් වූයෙන් නියමිත ත්‍යාග මුදල ඉක්මවා රු.5,302,245 ක් වැයකර තිබුණි.

(iii) මෙම දිනුම්වාරයට මුද්‍රණය කළ සියලුම ලොතරැයිපත් අලෙවි වීමට පෙර දිනුම් ඇදීම සිදු කිරීම හේතුවෙන් නොවිකිණී ඉතිරි වූ ලොතරැයිපත් 7204 ක මුද්‍රණ පිරිවැය වූ රු.396,220 ක් අනාර්ථික වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

**4.8 හඳුනාගන්නා ලද පාඩු**

-----------------------

32 වන කලම්බු එයාර්පෝට් සුපර් ඩ්‍රෝ ලොතරැයියේ දිනුම් ඇදීමට වලංගු කරන ලද රු.627,750 ක් වටිනා අස්ථානගත වූ ලොතරැයිපත් 135 ක වටිනාකම අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**4.9 මණ්ඩලයට එරෙහිව පවතින නෛතික සිද්ධි**

--------------------------------------------

මණ්ඩලයට එරෙහිව බාහිර පුද්ගලයන් 6 දෙනෙකු විසින් සේවය අත්හිටුවීම, මණ්ඩලයට සැපයූ සේවාවන් සඳහා ගෙවීම් නොකිරීම, අවලංගු කරන ලද තෑගි ඔප්පුවකට ණය ලබාදීම ආදි කරුණු මත රු.84,905,330 ක් වන්දි වශයෙන් ඉල්ලා උසාවි 6 ක නඩු පවරා ඇති බව අනාවරණය විය.

## 4.10 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම

-----------------------------------------------------------------

අනුරාධපුර හා මන්නාරම් දිස්ත්‍රික්කවල රජයට අයත් ඉඩම් 02 ක සංචාරක බංගලා ඉදිකර පවත්වාගෙන ගොස් තිබූ නමුත් එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.11 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදී ඇති මණ්ඩලයේ සම්පත්

----------------------------------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය ප්‍රකාර මණ්ඩලය සතු සම්පත් රේඛීය අමාත්‍යාංශය හෝ වෙනත් රාජ්‍ය ආයතන සඳහා ලබා නොදිය යුතු වුවද ඊට පටහැනිව මණ්ඩලයේ නිලධාරීන් 8 දෙනෙකු ද මුදල් අමාත්‍යාංශය සඳහා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මුදා හැර තිබුණි. තවද, එම නිලධාරීන් වෙත මණ්ඩලයෙන් ගෙවා තිබූ සේවක පාරිශ්‍රමික හා දිරි දීමනා රු.1,589,656 ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.12 කාර්යමණ්ඩල පරිපාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය වෙත කොන්ත්‍රාත් පදනම මත කලාප කළමනාකරුවන් 10 දෙනෙකු බඳවා ගැනීමට අනුමත වී තිබුණු නමුත් එම තනතුර සඳහා 14 දෙනෙකු බඳවාගෙන තිබීම හේතුවෙන් අනුමත සංඛ්‍යාව ඉක්මවා 04 ක් බඳවාගෙන තිබුණි. තවද, බඳවා ගැනීමේදී අනුමත බඳවා ගැනීම් පරිපාටියේ 5.4 ඡේදය ප්‍රකාරව ප්‍රසිද්ධ දැන්වීම් පලකර නොතිබුණු අතර සම්මුඛ පරීක්ෂණය සඳහා රේඛීය අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත්කර නොතිබුණි. තවද, අනුමත විෂය ධාරාවන් හා සේවා පළපුරුද්ද සපුරා නොමැති තැනැත්තන්ද එම තනතුරුවලට පත්කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලයේ කම්කරු හා සහාය නිවේදක යන තනතුරු 02 ට අනුමත කාර්ය මණ්ඩලය 31 දෙනෙකු වුවද එම සංඛ්‍යාව ඉක්මවා 20 දෙනෙකු බඳවාගෙන වැටුප් ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.1,381,698 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව එකඟතාවය නොමැතිව මණ්ඩලයේ අනුමත මූල්‍ය නිලධාරී තනතුර යටපත් කර අලෙවි/ප්‍රවර්ධන නිලධාරී තනතුරක් ඇතිකර තිබුණි. එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සඳහන් කිරීමෙන් තොරව කළමනාකරණ සහකාර තනතුරක් දරන අයකු 2017 අගෝස්තු 08 දින සිට එම තනතුරට පත්කර තිබූ අතර එමනිලධාරියාගේ වැටුප් වර්ධක 03 ක් විලම්භනය කරන ලෙස නියෝග කර තිබියදී එසේ කටයුතු කිරීමකින් තොරව නව තනතුරේ වැටුප් ගෙවීම් කර තිබුණි.

(ඈ) මණ්ඩලයේ කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ 5.4 ඡේදය ප්‍රකාරව, ප්‍රසිද්ධ දැන්වීම් පළකර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මත අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටි අය බඳවා ගැනීමට කටයුතු කළ යුතු විය. එහෙත් එම විභාගයට පෙනී සිටි බවට සනාථ නොකළ නිලධාරීන් 03 ක්ද විභාගයට පෙනී සිටි බවට සඳහන් කළද අධ්‍යාපන සහතික ඉදිරිපත් නොකළ කම්කරු නිලධාරීන් 04 ක්ද බඳවාගෙන තිබූ බව නිරීක්ෂණය විය

(ඉ) මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර (අලෙවි හා ප්‍රවර්ධන), ප්‍රධාන අලෙවි නිලධාරී ලෙස වෙනස් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකුගේ නිර්දේශය මත කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු එම තනතුරට පත් කර තිබුණි. එහෙත් එම තනතුරට හිමි වැටුප රු.41,566 ක් වුවද එය නොසලකා මාසිකව රු.90,000 ක වැටුපක් ගෙවා තිබුණු අතර ඊට අමතරව මණ්ඩලයේ අනෙකුත් කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන දිරිදීමනාද මාසික ඉන්ධන ලීටර් 200 ක්ද ලබාදී තිබුණි. ඒ අනුව, අදාල වැටුප ඉක්මවා මාසිකව රු.49,232 ක් ගෙවා තිබුණු අතර

අනෙකුත් දීමනා ලෙස මාසිකව වැඩිපුර ගෙවා තිබුණු මුදල රු.30,000 ක් විය. ඒ අනුව 2015 වර්ෂයේදී රු.295,392 ක්ද 2016 වර්ෂයේදී රු.590,784 ක්ද සමාලෝචිත වර්ෂයේදී රු.581,208 ක් ද වශයෙන් එකතුව රු.1,467,384 ක වැටුප් වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ප්‍රකාරව මානව සම්පත් කළමනාකරණය සඳහා වූ අත්පොතක් පිළියෙල කර නොතිබුණි.

**4.13 වෙළෙඳපොල කොටස**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන දෙකක් වූ ජාතික ලොතරැයි මණ්ඩලය හා සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් ලොතරැයි අලෙවි කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ජාතික ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොල කොටස සියයට 54.5 ක් වී තිබූ අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොල කොටස සමග සැසඳීමේදී එය 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 2 කින්ද 2015 වර්ෂයට සාපේක්ෂව සියයට 4 කින්ද පහළ ගොස් තිබුණි. තවද 2012 වර්ෂයේ සිට එය වාර්ෂිකව උච්චාවචනය වී තිබූ බව නිරීක්ෂණය වූ අතර විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ලොතරැයි විකුණුම් ආදායම | | ජාතික ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොල කොටස |
|---|---|---|---|
| | ජාතික ලොතරැයි මණ්ඩලය | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | |
| | රු.මිලියන | රු.මිලියන | % |
| 2017 | 16,747 | 13,982 | 54.5 |
| 2016 | 20,170 | 15,314 | 56.84 |
| 2015 | 17,394 | 12,265 | 58.65 |
| 2014 | 15,153 | 12,592 | 54.62 |
| 2013 | 14,537 | 10,611 | 57.80 |
| 2012 | 12,024 | 10,668 | 52.98 |

**4.14 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම දුර්වලතා**

මණ්ඩලය සතු තොරතුරු තාක්ෂණ පද්ධතියේ පවතින පහත දෝෂ මගහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(අ) පරිගණක පද්ධතියට දත්ත ඇතුල් කරන සහ දත්ත වෙනස් කරන පුද්ගලයින්ගේ අනන්‍යතාවය තහවුරු කරගත හැකිවන පරිදි විධිමත් රහස් අංක ක්‍රමයක් භාවිතා නොකිරීම.

(ආ) මුද්‍රණය කර ගබඩාවට ලැබී ඇති ලොතරැයිපත් ප්‍රමාණය ඉක්මවා විකුණුම් ඉන්වොයිසි නිකුත් කිරීමේ හැකියාව මණ්ඩලය සතු වර්තමාන පරිගණක පද්ධතියට පැවතීම නිවැරදි කිරීමට කටයුතු නොකිරීම.

(ඇ) අලෙවි නියෝජිතයින් අතර අන්තර් හුවමාරු ටිකට්පත් පිළිබඳ දත්ත පද්ධතියට ඇතුලත් කළ හැකි වන පරිදි පරිගණක පද්ධතිය වැඩිදියුණු කර නොතිබීම. මේ හේතුවෙන් මණ්ඩලය විසින් නිකුත් කළ ටිකට්පත් සම්බන්ධයෙන් අවසාන වගකීම දැරිය යුතු පාර්ශවයන් නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි වූ අවස්ථා නිරීක්ෂණය වීම.

(ඇ) 2012 වර්ෂයේදී මණ්ඩලය භාවිතා කරන සියලුම වාහන අධීක්ෂණයට වාහන කළමනාකරණ හා වාහනය තිබෙන ස්ථානය හඳුනා ගැනීමට රු.740,000 ක් වැයකර (Vehicle Management & Vehicle Tracking Module) මොඩියුලයන් මිලදීගෙන තිබුණද එහි තාක්ෂණික මෙවලම් උපකරණ නිසි පරිදි භාවිතා කර නොතිබීම හේතුවෙන් වාහන 02 කට අදාලව පමණක් එම උපකරණ ක්‍රියාකාරීත්වයේ පැවතුණි. එහෙත් මේ සම්බන්ධයෙන් කළමනාකරනයේ කිසිදු අවධානයක් යොමුකර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

---------------------

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

--------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්/ඩීජී/17 දරන රාජ්‍ය ප්‍රතිපත්ති හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පැවතුණි. එහෙත්, මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථයට වැටෙන කාර්යයන් සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කර ලඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ලඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------

### 6.1 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ සියලුම ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබු අතර අපේක්ෂිත අලෙවි ප්‍රවර්ධන අයිතමයන් සඳහා පමණක් ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි.

(ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ මෙහෙයවා තිබුණු ලොතරැයි වර්ග 11 කින් ලොතරැයි වර්ග 06 ක් සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව මුද්‍රණකරුවන් තෝරාගෙන තිබුණි. තවද 2015 මැයි 31 දින මුද්‍රණ කටයුතු සඳහා නව මුද්‍රණකරුවෙකු තෝරා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු 2018 මැයි 30 දක්වාම සිදුකර නොතිබුණි.

(ඇ) ප්‍රචාරණ ආයතන සමග ඇතිකරගත් ගිවිසුම් කාලය 2016 අප්‍රේල් 30 දින අවසන් වී ඇතත් නැවත ප්‍රසම්පාදනයකින් තොරව කාලය දීර්ඝ කරමින් එම ආයතනවලින්ම එම සේවාව ලබාගෙන තිබුණි.

## 6.2 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂවලදී වැඩිපුර ගෙවනලද රු.7,392,287 ක සේවක පාරිතෝෂික මුදල මණ්ඩලයට ආපසු අයකරගන්නා ලෙස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2013 මාර්තු 21 දින නියෝග කර තිබුණද එම මුදල අය කර ගැනීමට හෝ ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට හෝ කටයුතු කර නොතිබුණි. වැඩිපුර ගෙවා ඇති පාරිතෝෂික මුදල මණ්ඩලයට ප්‍රතිපූර්ණය කරන ලෙස අදාළ විශ්‍රාමික නිලධාරීන්ට ලිඛිතව දැන්වීම පමණක් මණ්ඩලය විසින් සිදු කර තිබුණි.

(ආ) 2014 නොවැම්බර් 04 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදී ලබාදී තිබූ නියෝගය අනුව, මණ්ඩලය සතු වොක්ෂෝල් වීදියේ පිහිටි පර්චස් 112 ක ඉඩමේ නව ගොඩනැගිල්ලක් ඉදිකළ යුතු විය. එහෙත් 2016 වර්ෂය අවසාන වන විටද ගොඩනැගිල්ලේ සැලසුම් කටයුතු සඳහා ගෘහ නිර්මාණ ශිල්පියෙකු තෝරා ගැනීම පමණක් සිදුකර තිබුණි. මෙම ඉදිකිරීම 2018 මැයි 31 දක්වා ආරම්භ කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ කාර්යාල හා ගබඩා කටයුතු පවත්වාගෙන යාමට ගොඩනැගිලි 03 ක් වෙනුවෙන් ගෙවා ඇති කුලිය රු.26,907,240 ක් විය.

## 6.3 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

මණ්ඩලය විසින් ලොතරැයිපත් මුද්‍රණය සඳහා වාර්ෂිකව කඩදාසි මෙ.ටොන් 700 කට වැඩි ප්‍රමාණයක් පරිහරණය කරනු ලැබුවද එම ලොතරැයිපත් වෙළෙඳපාලට මුදාහැරීමෙන් පසු පරිසරයට සිදුවන හානිය අවම කිරීම සඳහා කිසිදු විකල්ප ක්‍රියාමාර්ගයක් ගැන අවධානය යොමුකර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) පරිගණක ගිණුම්කරණ පද්ධතිය (ERP පහසුකම් සහිත ACCPAC ගිණුම් පද්ධතිය) විමධ්‍යගත කිරීම මත බිඳ වැටී ඇති ගණුදෙනු යවත්කාලීන නොකිරීම සහ නිවැරදි නොකිරීම, මෘදුකාංගය නිවැරදිව භාවිතා නොකිරීම. |
| | (ii) ඇස්තමේන්තුගත කළ සංඛ්‍යා ගිණුම්ගත කිරීම. |
| | (iii) මාසිකව නැවත නැවත ජ'නල් වවුචර් විශාල සංඛ්‍යාවක් යෙදීම සහ එකම අංකය යටතේ ජ'නල් වවුචර් යෙදීම, පොදු ජ'නලය නිවැරදිව නඩත්තු නොකිරීම, ජ'නල් වවුචර් අනුමැතියකින් තොරව ගිණුම්ගත කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මෙහෙයුම් පාලනය | (i) | නොවිකුණු බවට සනාථ කළ ලොතරැයිපත් එම නියෝජිතයින් විසින් ආපසු මණ්ඩලය වෙත භාරදී නොමැති විට ඔවුන්ගෙන් අයකළ යුතු අධිභාර ගිණුම්ගත කර නොතිබීම. |
| | | (ii) | ලොතරැයිපත් කාණ්ඩ අංක සාවද්‍ය ලෙස වෙනත් ලොතරැයි බිල් පත්‍රයක මුද්‍රණය කර නිකුත් කිරීමේ හැකියාව අවහිර කිරීමේ ආරක්ෂිත ක්‍රම හඳුන්වා නොදීම. |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | | බඳවාගැනීම් හා උසස්කිරීම් එම පරිපාටිවලට අනුකූලව සිදු නොකිරීම හා පුරප්පාඩු පවතින තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීම සඳහා සැලසුම් සකස්කර නොතිබීම. |
| (ඈ) | ණයගැති පාලනය | | විමධ්‍යගත කළ පරිගණක පද්ධතිය මගින් ණයගැති කාල විශ්ලේෂණයන් ලබා ගැනීමට නොහැකි වීම. |
| (ඉ) | කොන්ත්‍රාත් පාලනය | | කොන්ත්‍රාත් ගිවිසුම් පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් නොකිරීම. |
| (ඊ) | ගබඩා පාලනය | | අලෙවි ප්‍රවර්ධන අයිතම තොග ලේඛනවල ඇතුලත් නොකිරීම. |